# පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය
# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## අනධ්‍යයන කාර්යමණ්ඩල පුරප්පාඩු

මෙම ආයතනයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා නියමිත සුදුසුකම් ඇති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල **ස්ථිර සේවයේ නියුතු සේවක භවතුන්** ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සමඟ එවා ඇති ආදර්ශ අයදුම්පතට අනුව සකස් කරගත් අයදුම්පත්, තමා සේවය කරන ආයතනයේ ලේකම්/ලේඛකාධිකාරී/අධ්‍යක්ෂ/මණ්ඩපාධිපති මගින් 2020.08.17 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, දුටුගැමුණු වීදිය, කොහුවල** යන ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකළ, අපහැදිලි හෝ නියමිත දිනට පසුව ලැබෙන හෝ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙන අතර එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පත් කුමන හේතුවක් නිසාවත් නැවත සලකා බලනු නොලැබේ.

1996.10.18 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 692 විධිවිධාන අනුව අදාළ පරිදි ලිඛිත, යෝග්‍යතා හෝ ප්‍රායෝගික පරීක්ෂණයක හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත කුසලතාව පදනම් කරගෙන සුදුස්සන් තෝරාගනු ලැබේ.

### 01. කළමනාකරණ සහකාර (සරප්) 111 ශ්‍රේණිය තනතුර

**සුදුසුකම් :**

**1.** අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එකම වතාවක දී විෂයයන් හයකින් (06) සමත් විය යුතු අතර අවම වශයෙන් විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ සහිත විය යුතුය. එසේ සම්මාන සාමාර්ථ ලබා ගත් විෂයයන් අතරට සිංහල/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය හා ගණිතය යන විෂයයන් ඇතුළත් විය යුතුය.

**11.** අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් එක් වරකදී ගණකාධිකරණය ඇතුළුව සියලුම විෂයන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම.

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

(අ) මාස හයකට නොඅඩු කාලයක් පිළිගත් ආයතනයක පරිගණක භාවිතය පිළිබඳ සුදුසුකමක් ලබා තිබීම.

**සහ**

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද

**සටහන : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව/උසස් අධ්‍යාපන ආයතනය තීරණය කර ඇති පරිදි ආරක්ෂක තැන්පතුවක් තැන්පත් කළ යුතුයි.**

**වැටුප් ක්‍රමය :** UMN 1 (III A) – 30,725 - 17×300 - 35,825 (මාසික)
(මෙය වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම :** ලිඛිත පරික්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 02. පුස්තකාල තොරතුරු සහකාර (III ශ්‍රේණිය)

**සුදුසුකම් :**

**I. (අ)** සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය යන විෂයන්ගෙන් දෙකක් ඇතුළුව විෂයයන් 05 කට සම්මාන සාමාර්ථ සහිතව අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත් වී තිබීම.

**හෝ**

**(ආ)** තුන්වරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06 කින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව ඇති සහ උසස් අධ්‍යාපන ආයතනයක පුස්තකාලයක වසර 05 කට නොඅඩු සතුටුදායක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක සේවකයකු විය යුතුයි. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී සමත්ව ඇති විෂයයන්ගෙන් 02ක් සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සාහිත්‍යය විය යුතුය.

**සටහන : පුස්තකාල කටයුතු පිළිබඳ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ලබා ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.**

**වැටුප් ක්‍රමය :** UMN 1 (III A) – 30,725 - 17×300 - 35,825 (මාසික)
(මෙය වැටුප් කොමිෂන් සභා චක්‍රලේඛ අංක 17/2016 අනුව 2020 වර්ෂයට අදාළ වැටුප් පරිමාණය වේ. මෙයට අමතරව රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

**තෝරා ගැනීම :** ලිඛිත පරික්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

**එල්.ඒ. සුමිත් ජයසේකර**
**ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි**
2020.07.28